www.agaram.lk

සියලුම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education - Western Province

# වර්ෂ අවසාන ඇගයීම
ஆண்டிறுதி மதிப்பீடு - 2019
Year End Evaluation

| | | | |
|---|---|---|---|
| ශ්‍රේණිය / தரம் / Grade: 09 | විෂයය / பாடம் / Subject: නාට්‍ය හා රංග කලාව | පත්‍රය / வினாத்தாள் / Paper: I ,II | කාලය / காலம் / Time: පැය 02යි. |

නම:-.................................................... විභාග අංකය:-....................................

සැලකිය යුතුයි.
- පළමු කොටසේ සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
- 1 සිට 20 දක්වා ප්‍රශ්නවලදී (1, 2, 3, 4) යන පිළිතුරුවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

## I කොටස

01. නාට්‍යයේ තේමාව උද්දීපනය වන පරිදි, උචිත සංවාද ගොඩ නැඟීම.
    i. අංග රචනා ශිල්පියාගේ කාර්යයකි. ii. අධ්‍යක්ෂකවරයාගේ කාර්යයකි.
    iii. පෙළ රචකයාගේ කාර්යයකි. iv. රූපණ ශිල්පියාගේ කාර්යයකි.

02. බොහෝ විට නාට්‍යයක චරිත අතර ප්‍රතිවිරෝධී අදහස් මතුකර ඉදිරියට ගලා යාම හඳුන්වන්නේ,
    i. අභිනය නමිනි. ii. සංවාද නමිනි. iii. රූපණය නමිනි. iv. ගැටුම නමිනි.

03. නාට්‍යයක ආලෝකකරණ තත්වයන් යටතේ යටපත් විය හැකි මුහුණේ හැඩතල, ඉරියව් හා ත්‍රිමාණ ලක්ෂණ මතුකර දැක්වීම සඳහා රූපණ ශිල්පියාට සහය වන්නේ,
    i. ආලෝකකරණයයි. ii. වේෂ භූෂණයයි. iii. අංග රචනයයි. iv. පෙළ රචනයයි.

04. මහාචාර්ය එදිරිවීර සරච්චන්ද්‍රයන් විසින් ජාතක කතා ඇසුරින් නිර්මාණය කරන ලද නාට්‍යයක් වන්නේ මින් කුමක් ද?
    i. ලෝමහංස ii. රත්තරං
    iii. මුදලාලිගේ පෙරළිය iv. එලොව ගිහින් මෙලොව ආවා

05. මනසින් යමක් මවා ගැනීම හඳුන්වනු ලබන්නේ,
    i. සංවාද නමිනි. ii. නිරූපණය නමිනි.
    iii. උපකල්පනය නමිනි. iv. පරිකල්පනය නමිනි.

06. විදේශීය නාට්‍යයකින් ලබාගත් තේමාවක් අනුව නිර්මාණය කළ "බක්මහ අකුණු" නාට්‍යයේ නිෂ්පාදකයා කවු ද?
    i. ගුණසේන ගලප්පත්ති ii. දයානන්ද ගුණවර්ධන
    iii. රංජිත් ධර්මකීර්ති iv. සෝමලතා සුබසිංහ

07. පුද්ගලයෙක් තවත් පුද්ගලයෙක් සමඟ ඇස්වල සම්බන්ධතාවය සෘජුව පවත්වාගෙන යාමට අපොහොසත් වේ. මෙම දුර්වලතාවය මඟ හරවා ගැනීමට සුදුසු ම අභ්‍යාසය වන්නේ,
    i. සංවේදන අභ්‍යාසයයි. ii. රංග ක්‍රීඩායි.
    iii. දර්පණ තල අභ්‍යාසයයි. iv. ශිථිලීකරණ අභ්‍යාසයයි.



Agaram.LK - Keep your dreams alive!
Agaram.LK - Keep your dreams alive!
agaram.lk

www.agaram.lk

08. නාට්‍ය පෙළ රංගයක් බවට පත් කිරීමේදී, අධ්‍යක්ෂකවරයාට සහාය දක්වන ප්‍රධාන ශිල්පියා වන්නේ,
i. රංගාලෝක ශිල්පියා ය.
ii. සහය අධ්‍යක්ෂකවරයා ය.
iii. වේදිකා පරිපාලකයා ය.
iv. පසුතල හා රංග භාණ්ඩ සැලසුම්කරුවා ය.

09. සාමූහිකව කටයුතු කිරීමේ හැකියාව වර්ධනය කරගත හැකි වන්නේ,
i. ශ්වසන අභ්‍යාස මඟිනි.
ii. සංවේදන අභ්‍යාස මඟිනි.
iii. රංග ක්‍රීඩා මඟිනි.
iv. දර්පණ අභ්‍යාස මඟිනි.

10. පහත දැක්වෙන කරුණු අතුරින් නාට්‍ය පිටපතට අයත් නොවන අංගය කුමක් ද?
i. අභිනය තිබීම
ii. කථා වස්තුවක් තිබීම.
iii. ගැටුම අන්තර්ගත වීම.
iv. චරිත අන්තර්ගත වීම.

11. පහත සඳහන් නාට්‍ය අතුරින් නාට්‍ය ධර්මී සම්ප්‍රදායට අනුව නිෂ්පාදනය නොවූ නාට්‍ය කුමක් ද?
i. ලෝමහංස
ii. මහාසාර
iii. මනමේ
iv. කැලණි පාලම

12. ''අනුකරණය'' සම්බන්ධ නිවැරදි ප්‍රකාශය වන්නේ මින් කුමක් ද?
i. නිරීක්ෂණයෙන් තොරව ඉදිරිපත් කිරීමයි.
ii. පුද්ගල චරිතයක්, ක්‍රියාවක්, අවස්ථාවක් ඒ අයුරින්ම කර පෙන්වීමයි.
iii. පුද්ගල චරිතයකට ආවේශ වීම හෙවත් ආරූඪ වීමයි.
iv. නිර්මාණාත්මකව මවා ගත් රූපය ප්‍රතිනිර්මාණය කිරීමයි.

13. ''ක්ෂණික නිරූපණය''. සම්බන්ධව නො ගැළපෙන ප්‍රකාශය වන්නේ මින් කුමක් ද?
i. රූපණ හැකියාව දියුණු වේ.
ii. තමන් තුළ ඇති අනුකරණ හැකියාව නිදහසේ භාවිතා කළ හැකි ය.
iii. චරිත නිර්මාණාත්මකව ඉදිරිපත් කිරීමට අපහසු ය.
iv. ක්ෂණික තීරණ ගැනීමේ හැකියාව වර්ධනය වේ.

14. තරිබෑණා නාට්‍යයට අයත් ගීතයක් වනුයේ මින් කුමක් ද?
i. මුදු පතුල යට ඉඳලා
ii. මඬේ ලගින තාරාවන්
iii. ඇහැල මලින් ගස් පිරිලා
iv. ගල්ලෙන බිඳලා

15. නාට්‍යයක අදහස් ප්‍රකාශ කිරීමේදී
i. ආංගික අභිනය ප්‍රධාන වේ.
ii. වාචික අභිනය ප්‍රධාන වේ.
iii. සාත්වික අභිනය ප්‍රධාන වේ.
iv. ආහාර්ය අභිනය ප්‍රධාන වේ.

16. පහත සඳහන් ප්‍රකාශ අතුරින් නාට්‍ය ගී පිළිබඳව නිවැරදි ප්‍රකාශය වන්නේ මින් කුමක් ද?
i. නාට්‍ය සංගීතය ආංගික අභිනයට අයත් වේ.
ii. නාට්‍ය ගීත රඟපාමින් ගායනය කළ නො හැකි ය.
iii. නාට්‍ය ගීතවල ඒකාකාරී නාද මාලාවක් ඇත.
iv. ගායනයෙන් හා රංගනයෙන් නාට්‍ය ගීතයෙහි අදහස මතුකර දැක්විය යුතු ය.

17. ''සංවාද භාවිතා නොකර කිසියම් සිද්ධියක් හෝ අවස්ථාවක් නිරූපණය කිරීම'' අප හඳුන්වන්නේ
i. සමාරෝපය නමිනි.
ii. අනුකරණය නමිනි.
iii. අභිරූපණය නමිනි.
iv. අනුරූපණය නමිනි.

18. යම්කිසි නාට්‍යයක සාර්ථක අසාර්ථක භාවයට ප්‍රධාන වශයෙන් බලපානු ලබන්නේ,
i. අංග රචනයයි.
ii. නාට්‍ය පෙළයි.
iii. සංගීතයයි.
iv. රූපණයයි.




Agaram.LK - Keep your dreams alive!
Agaram.LK - Keep your dreams alive!
agaram.lk

www.agaram.lk

19. නාට්‍යයක රංග විධාන සම්බන්ධ වැරදි කියමන වන්නේ මින් කුමක් ද?
   i. නාට්‍ය පිටපතක වරහන් තුළ දක්නට ලැබෙන වචනය.
   ii. නළු නිළියන්ට රංග කාර්යය සඳහා ලබා දෙන උපදෙස් ය.
   iii. අංග රචනය සඳහා ලබාදෙන උපදෙස් ය.
   iv. නාට්‍ය අධ්‍යක්ෂවරයාට දෙන ලද උපදෙස් ය.

20. නළුවා වෙනත් චරිතයකට ප්‍රවේශවීම හඳුන්වනු ලබන්නේ,
   i. අනුකරණය යනුවෙනි.
   ii. සමාරෝපය යනුවෙනි.
   iii. අභිනය යනුවෙනි.
   iv. නළුවරණය යනුවෙනි.

2 x 20 ල. 40

## II කොටස

උපදෙස්: **II කොටසේ පළමු ප්‍රශ්නයට පිළිතුරු සැපයීම අනිවාර්ය වේ. තෝරාගත් තවත් ප්‍රශ්න හතරක් ඇතුළුව ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.**

01. i. "අතට වළලු ද පයට ගිගිරි ද ලා ගනී" යන ගීතය ගයමින් වේදිකාවට පිවිසෙන්නේ කදා වළලු නාට්‍යයේ කුමන චරිතය ද? (ලකුණු 02)
   ii. කදා වළලු නාට්‍යය නිර්මාණය වූයේ කුමන ජාතක කතාවක් ඇසුරින් ද? (ලකුණු 02)
   iii. කදා වළලු නාට්‍යයේ ගැටුම් අවස්ථාව නිරූපණය වීමට පාදක වූ භාණ්ඩයේ නම කුමක් ද? (ලකුණු 02)
   iv. කදා වළලු නාට්‍යය ඇසුරින් සමාජයට දෙනු ලබන පණිවුඩය කුමක් ද? (ලකුණු 02)
   v. කදා වළලු නාට්‍යයේ එන ප්‍රබල චරිත දෙකක් නම් කරන්න. (ලකුණු 02)
   vi. කදා වළලු නාට්‍යයේ නිෂ්පාදකයා කවුද? (ලකුණු 02)
   (මුළු ලකුණු 12)

02. i. රංග අභ්‍යාස 02ක් නම් කරන්න. (ලකුණු 02)
   ii. ඉන් එක් රංග අභ්‍යාසයක් සිදුකරන ආකාරය කෙටියෙන් ලියන්න. (ලකුණු 04)
   iii. රූපණ ශිල්පියෙකු රංග අභ්‍යාසවල නිරත වීමෙන් ලැබෙන ප්‍රයෝජන පිළිබඳව කෙටි විස්තරයක් කරන්න. (ලකුණු 06)

03. i. නාට්‍යයකට ආනුෂංගික අංග අවශ්‍ය වන්නේ ඇයි? (ලකුණු 02)
   ii. ආනුෂංගික අංග හතරක් නම් කරන්න. (ලකුණු 04)
   iii. නාට්‍යයකට ආනුෂංගික අංග යොදා ගැනීමේදී සැලකිලිමත් විය යුතු කරුණු පිළිබඳව කෙටි විස්තරයක් කරන්න. (ලකුණු 06)

04. i. ගැමියන් ශාන්තිකර්ම පවත්වනු ලැබුවේ කුමක් අරමුණු කොට ගෙන ද? (ලකුණු 02)
   ii. දේශීය ශාන්ති කර්මවල එන බෞද්ධ පූජා කර්ම 3 ක් නම් කරන්න. (ලකුණු 03)
   iii. ඉන් එක් පූජා කර්මයක ඇති ප්‍රාසාංගික ලක්ෂණ පිළිබඳව විස්තර කරන්න. (ලකුණු 07)

05. i. නාට්‍ය ශෛලීන් දෙකක් නම් කරන්න. (ලකුණු 02)
   ii. එම නාට්‍ය ශෛලීන්වල ලක්ෂණ කෙටියෙන් හඳුන්වන්න. (ලකුණු 04)
   iii. නාට්‍ය ශෛලිය හඳුනාගැනීමට පෙළ අධ්‍යයනයේදී නිරීක්ෂණය කළ යුතු අංග මොනවාද යි කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 06)



Agaram.LK - Keep your dreams alive!
agaram.lk

www.agaram.lk

(ලකුණු 0

06. i. චරිත නිරූපණය යනු කුමක් ද? (ලකුණු 0

ii. චරිතයක දැකිය හැකි විවිධ පැතිකඩ හඳුන්වන්නේ කුමන නමකින් ද?

iii. අනුකරණය, සතර අභිනය, සමාරෝපය චරිතයක් නිරූපණය කිරීමේදී භාවිතා වන අකාරය කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 0

07. පහත දැක්වෙන අවස්ථාව පාදක කරගෙන කෙටි නාට්‍යයකට සුදුසු පෙළ රචනයක් ලියන්න. මෙහිදී ඔ කැමති පරිදි නාට්‍යයේ අවසානය නිර්මාණය කළ හැකි ය.

ළමයෙක් දිය නෑමට ළිඳට යයි. ළිඳට බාල්දිය දැමීමට හදන අවස්ථාවේ ළිඳ තුළ යමක් පෙනේ. ඇය ළිඳ එබිකම් කර බලයි. අවට සිටින්නන්ටද කතා කරයි. සියල්ලෝම ළිඳට එබී බලයි. යමෙක් අසල ති කොක්කක් සහිත ලීයක් ළිඳට දමා අමාරුවෙන් යමක් ගොඩ ගනී. ලීයේ පැටලී ඇත්තේ පූසෙක් "පූසෙක්" යැයි අවට සිටින්නෝ කෑ ගසති. පූසා මිය ගොස් ය. ඌ ඉදිමී ගඳ ගසන බව අයෙක් පවසයි ඇතැමෙක් පිළිකුල අභිනයෙන් දක්වති. ......

(ලකුණු 04

i. නාට්‍යෝචිත අවස්ථා නිර්මාණය කිරීම. (ලකුණු 08

ii. සංවාද හා රංග විධාන සහිතව පෙළ රචනා කිරීම.





Agaram.LK - Keep your dreams alive!

Agaram.LK - Keep your dreams alive!

agaram.lk

agaram.lk